# ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි බෞද්ධ සංස්කෘතික සංකල්ප සම්ප්‍රේෂණයෙහිලා කලා නිර්මාණයන්ගේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඒ. ගාමිණී විජයසිංහ
ශිෂ්‍ය අංකය : 2010/ PhD/ S/ 2877

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය (කැලණිය විශ්වවිද්‍යාලය) වෙත දර්ශන විශාරද උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)
සුනේත්‍රා මහාදේවි පිරිවෙන් විද්‍යායතන පරිශ්‍රය,
පැපිලියාන, බොරලැස්ගමුව

2013

23 OCT 2013

# හැඳින්වීම

ක්‍රි.පූ. 03 සියවසේදී සිදු වූ මහින්දාගමනය කේන්ද්‍ර කර ගනිමින් ශ්‍රී ලංකාවට බුදු දහම ලැබුණු බව ප්‍රකටය. ඉතා කෙටි කලක් තුළ මෙරට සමස්ත භූගෝලීය කලාපයන්ම ආවරණය වන පරිදි එහි ව්‍යාප්තියද ඉතා සාර්ථකව තහවුරු වූ ආකාරය පෙනී යයි. එවකට පැවති විවිධ විචිත්‍ර භින්නරුචික සමාජය කෙරෙහි මූලික බෞද්ධ සංකල්ප සම්ප්‍රේෂණයෙහිලා ප්‍රාථමික වශයෙන් අනුගමනය කළ ප්‍රබලතම මාධ්‍යය දේශන ක්‍රමයයි. මිහිදු මහ රහතන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා ඇසුරින් සිදුවූ මෙම ක්‍රියාවලිය මඟින් බෞද්ධ සංස්කෘතිය කෙරෙහි පොදු ජනතාවගේ නැඹුරුව වඩාත් තීව්‍ර කරවූ බව පැහැදිලිය. මීට සමගාමීව බුදු දහමේ දැක්වෙන ගැඹුරු සංකල්ප වඩාත් සරලව හා ජනකාන්ත අයුරින් ජනතාවට සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉතා සාර්ථක ක්‍රමයක් වශයෙන් කලා නිර්මාණ භාවිත කිරීමට උනන්දු වූ ආකාරය හඳුනාගත හැකිය. මෙය හුදෙක්ම භික්ෂු ආරාමය මුල් කරගනිමින් සිදුවීම විශේෂත්වයක් ලෙස සැලකිය හැකිය. ආරම්භයේදී භික්ෂු වාසස්ථාන ලෙස යොදාගත් ස්ථාන බෞද්ධ සංස්කෘතික සංකල්ප සන්නිවේදනය කළ කලාගාර වශයෙන් සංවර්ධනය වන්නේ යථෝක්ත පසුබිම පදනම් කර ගැනීමෙනි. නිර්මාණකරුවා ග්‍රහණය කරගත් බෞද්ධ සංකල්ප පිළිබඳ දැනුම සිය නිර්මාණ මගින් ප්‍රතිනිර්මාණය කිරීමට දරූ ප්‍රයත්නයන්හි යථාස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක ප්‍රතිඵල වශයෙන් මෙම නිබන්ධනය එළිදැක්වෙන බව සඳහන් කළ හැකිය.

මෙම පර්යේෂණයේදී දුෂ්කරතා රාශියක් කෙරෙහි යොමු වීමට සිදු වේ. ඓතිහාසික තොරතුරු විමර්ශනයට අදාළ මූලාශ්‍රයන්හි දැක්වෙන විවිධත්වය හා ඇතැම් කරුණු කාල්පනික ව්‍යාඛ්‍යාකරණයන් වීම එහිලා ප්‍රධානත්වයක් ගනී. තවද කලාකෘති මඟින් ප්‍රකට වන සංකේතාර්ථ පිළිබඳව සමාජයේ සාම්ප්‍රදායිකව මතවාද රාශියක් පැතිර පැවතීමද එවැනිම අභියෝගයකි. කෙසේ වෙතත් ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි බෞද්ධ සංස්කෘතික සංකල්ප සම්ප්‍රේෂණයෙහිලා කලා නිර්මාණයන්ගේ දායකත්වය ප්‍රකටව දක්නට ලැබෙන බව සඳහන් කළ හැකිය.

මෙම පසුබිම පිළිබඳව අධ්‍යයනයන්හි නියැලුණු ප්‍රාමාණික විද්වතුන් හා ඔවුන්ගේ ගවේෂණ වාර්තා සැලකිය යුතු ප්‍රමාණයක් දක්නට ලැබෙන බවද මෙහිලා අවධාරණය කළ යුතුය. ඒ යටතේ මහාචාර්ය සෙනරත් පරණවිතාන සුවිශේෂත්වයෙහිලා සැලකිය

හැකිය. 1940 වර්ෂයේදී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ධූරය දරූ ඔහු ඊට පෙර හා පසුව මෙරට බෞද්ධ කලාව හා පුරාවස්තු පිළිබඳව කළ ගවේෂණ ඇසුරින් ප්‍රකාශයට පත්කර ඇති සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් රචිත ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි රාශියකි. සංඛ්‍යාත්මකව ඒවා 388 ක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ බෞද්ධ මූර්ති, කැටයම්, චිත්‍ර හා අනෙකුත් බෞද්ධ කලාකෘති පිළිබඳව එමඟින් දැකිය හැකිය. ශ්‍රී ලාංකේය බෞද්ධ කලාකෘතීන්හි සංකේතාර්ථ පිළිබඳව එහිලා දක්වා ඇති විමර්ශනාත්මක කරුණු විශේෂයෙන් වැදගත් වේ. Sinhalese Art and culture, Art and Architecture of Ceylon, A Royal paradise of Ancient Ceylon හා සිංහල සඳකඩ පහන්වල නිමිත්තකරණය, ශ්‍රී ලංකාවේ ස්තූපය ආදී කෘති මෙම පර්යේෂණයට ඍජුවම සම්බන්ධ ක්ෂේත්‍ර අවධාරණය කර ඇති බව සඳහන් කළ යුතුය.

තවද කඹුරුපිටියේ වනරතන හිමියන්ගේ ලක්දිව බුදු පිළිමය නම් කෘතියද මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතාගේ ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු වැනි කෘතින්ද ආචාර්ය එම්. සෝමතිලගේ Ancient Buddhist Mural Paintings of India and Sri Lanka කෘතියද දර්ශන රත්නායක මහතාගේ මහනුවර චිත්‍ර සම්ප්‍රදාය සහ සමාජය කෘතියද ආදී වශයෙන් මෙම පර්යේෂණයේ විවිධ ක්ෂේත්‍ර කෙරෙහි අදාළ කරගත හැකි ප්‍රාමාණික කෘති වශයෙන් සැලකිය හැකිය. එසේ වුවද මෙම පර්යේෂණයන්ගේ අවධානය බොහෝ විට එක් ක්ෂේත්‍රයකට පමණක් සීමා වන බව සඳහන් කළ යුතුය.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා නිර්මාණයන්හි ප්‍රභවය උදෙසා මහින්දාගමනය තීරණාත්මක ලෙස බලපෑ බව සඳහන් කළ යුතුය. මෙරට බුද්ධ ශාසනය පිහිටුවීම හා ඊට සමාගමීව භික්ෂු සංවිධානයේ සමාරම්භය ආරාමීය සංස්කෘතිය කෙරෙහි බෙහෙවින්ම උපස්ථම්භක විය. එම පසුබිම ඇසුරින් බෞද්ධ ශිල්ප කලා විෂය ආරම්භ වූ අතර ප්‍රාග් බෞද්ධ ජන සමාජයේ පැවති නිර්මාණාත්මක හා තාක්ෂණික දැනුම බෞද්ධ ආභාසය සහිතව තවදුරටත් වර්ධනය වූ ආකාරය දැකිය හැකිය. එමෙන්ම ඉහත සමස්තය විෂයෙහි ඉන්දියානු බලපෑම ද නොයෙක් අයුරින් දැකිය හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්පයේ ප්‍රභවය හා සම්බන්ධ පසුබිම මෙහි ප්‍රථම පරිච්ඡේදයෙන් අවධාරණය වේ.

එසේම බෞද්ධ ශිල්ප කලාවන්ගේ විවිධතා රාශියක් කෙරෙහි ඉවහල් වූ සාධක ද ඉතා වැදගත් වේ. ඒ අනුව මෙරට බෞද්ධ කලාවේ රක්ෂණය පෝෂණය හා නිර්මාණ

විශේෂතා සඳහා බලපෑ දේශපාලන දායකත්වය අවධානයට ලක්විය යුතු වේ. තවද හින්දු ආදී අන්‍යාගමික ප්‍රවණතා මෙන්ම මහායානාදී බෞද්ධ නිකායන්ගේ බලපෑම්ද ශිල්ප කලාවන්ගේ විචිත්‍රතා කෙරෙහි උපස්ථම්භක වූ බව ප්‍රකටය. විශේෂයෙන් පැරණි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ අධ්‍යාපන රටාවද ප්‍රබලව මේ සඳහා බලපෑම් ඇති කරන ලද බව ප්‍රකටය. එහෙයින් යථෝක්ත පසුබිම පිළිබඳව විමර්ශනය මෙහි දෙවැනි පරිච්ඡේදය යටතේ සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

මීට අමතරව බෞද්ධ කලා ශිල්ප අතුරින් මූර්ති කලාව බෞද්ධ සංස්කෘතික සංකල්ප සන්නිවේදනයෙහිලා භාවිතා වී ඇති ආකාරය විමශීනය කිරීම සඳහා තුන්වැනි පරිච්ඡේදය යොදා ගැනේ.

තවද බෞද්ධ ගොඩනැගිලි ආශ්‍රිතව දක්නට ලැබෙන කැටයම් කලාව ප්‍රස්තුතය පෝෂණය කිරීම්හිලා අදාළ වී ඇති ආකාරය හතරවැනි පරිච්ඡේදය යටතේ පරීක්ෂාකිරීමට අපේක්ෂිතය.

එමෙන්ම බෞද්ධ කලා ශිල්ප අතර චිත්‍ර මාධ්‍යය බෞද්ධ සංකල්ප සමාජයට සම්ප්‍රේෂණය කිරීමේහිලා සාර්ථක ලෙස භාවිත කර ඇති ආකාරය බෞද්ධ විහාර, ස්තූප හා වෙනත් පූජනීය ස්ථාන ආශ්‍රිත සිතුවම් පරීක්ෂා කිරීමේදී තහවුරු කර ගත හැකිය. ඒ අනුව මෙහි පස්වැනි පරිච්ඡේදය ලාංකික බෞද්ධ චිත්‍ර කලාව සඳහා වෙන් වේ.

සමස්තයක් වශයෙන් ආගමික පසුබිමක් තුළ නිර්මාණ ශිල්පියා ලැබූ අත්දැකීම් සිය කලා මාධ්‍යයෙන් සමාජගත කිරීමට දැක් උනන්දුව මෙරට බෞද්ධ සංස්කෘතියේ පරිසමාප්තිය කෙරෙහි බලපෑ ආකාරය සැලකිල්ලට ගැනේ.